වයිරස ආසාදනය



# පැපොල් රෝගය

## වැදගත් කරුණු

- පැපොල් රෝගය උණ සහ සමේ ලකුණු ඇතිවන වයිරස ආසාදනයකි.
- සමේ ලකුණු වැඩි වශයෙන් දැකිය හැක්කේ ශරීරයේ මැද ඔලුවේ සහ බෙල්ලේය.
- දරුවා දින 7 ක් පමණ ආසාදනයට භාජනයවේ. මුලින්ම ලකුණු මතුවීමට දින 2 කට පෙර සහ ලකුණු මතුවී දින 5 කට පසුව.
- දරුවන් පාසැලෙන්, පෙර පාසැලෙන් හෝ ළමා රැකවරණ මධ්‍යස්ථාන වලට යැවීම සමේ සියලුම ලකුණු වල සිවිය හැලෙන තෙක් නොකළ යුතුය.
- වියලි කබල ආසාදනය නොවේ.
- ප්‍රථිකාරය රෝග ලක්‍ෂණයට හෝ දෙවන බැක්ටීරියා ආසාදනයක් වැළැක්වීමට උපකාර වේ.

## එය මොකක්ද?

පැපොල් රෝගය පොදු වයිරසයක් වන (varicella-zoster) වලින් ඇති කරණ පොදු ආසාදනයකි. උණ ගතිය ඇතිව දරුවා දිනකට හෝ දෙකකට අසනීප ගතියකින් පෙලෙයි. ඊලඟට සමේ රතු පැහැය ඇතිවී කුඩා රත් පැහැය තඩිස්සි (කළු හමක එය දම් හෝ දුඹුරු පැහැය ගනී) ඉදිරි දින 2-4 ඇතුලත විසප්පු බවට පත්වේ. දින කීපයක් මෙම විසප්පු සැරව සමග සුදු පැහැයක් ගන්නා අතර ඊට පසු කළු වියලි සිවියක් බවට පත්වේ.

ඔලුව බෙල්ල සහ ශරීරයේ මැද කොටස ලකුණු බහුලව පවතින අතර අත් සහ පා වල දුර්ලබය. ළකුණු ගණන වෙනස් විය හැක.

වයස අවුරුදු 2-10 දක්වා දරුවන් කෙරෙහි වඩාත් බලපානු ලැබේ. ආසාදනයට ලක්වූ කෙනෙකු හා ආශ්‍රය කිරීමෙන් සති දෙකකට පමණ පසුව උණ සහ පළු ඇතිවේ. පැපොල රෝගය ආසාදනය වීම, මුලින්ම ලකුණු මතුවීමට දින 2 කට පෙර සහ මුල් වරට ලකුණු මතුවී දින 5 කට පසුව සිදුවේ. වියලි කබල ආසාදනය නොවේ. එක් වතාවක් පැපොල රෝගය වැළඳී ඇති කෙනෙකුට දිගු කලක් පවත්නා නිදහස්වීමක් (immunity) ඇති බැවින් දෙවන වතාවටත් එම රෝගය වැළදෙන්නේ නැත.

## එය වලක්වා ගත හැක්කේ කෙසේද?

අන් අය ආසාදනය කිරීමෙන් වැලකීම, දරුවන් පාසැලට, පෙර පාසැලට හෝ ළමා රැකවරණ මධ්‍යස්ථාන වලට යැවීම සමේ සියලුම ලකුණු වල සිවිය හැලෙන තෙක් නොකිරීම. අත් එන්නත් කිරීමේ සාමාන්‍ය ක්‍රියා පිළිවෙතේ කොටසක් නොවුවත් පැපොල් රෝගය සඳහා එන්නත් තිබේ. වයස මාස 12 න් ඉහල දරුවන්ට එක බෙත් වේලකින් මෙය දෙනු ලැබේ.

## ඊට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

පැපොල රෝගය සෑදුන බොහෝ ළමයින්ට කිසියම් විශේෂ ප්‍රථි වෛරස ප්‍රථිකාරයක් අවශ්‍ය නැත. ප්‍රථිකාරය යොදා ගන්නේ උණ පාලනය කර ගැනීමටත් දෙවන වරටත් සමේ ළකුණු වල බැක්ටීරියා

**Singhalese - Chicken Pox**

ආසාදනයක් වළක්වා ගැනීමටත්ය. බැක්ටීරියා ආසාදනයක් ඇති වූවහොත් එහි ප්‍රථිපලයක් වශයෙන් කැළලක් හට ගනී. ප්‍රථි බැක්ටීරියා සහ කැසීම වැළැක්වීම සඳහා bath oil උපකාරී වේ.
දෙවන වරටත් සමේ ළකුණු වල බැක්ටීරියා ආසාදනයක් වළක්වා ගැනීම සඳහා ප්‍රථිනාශක බේත් (antiseptic) පාවිච්චිය සුදුසුය.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖෂධ වේදියා
ඔබේ පවුලේ දොස්තර මයා/මිය
වර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent’s Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.